# 2008: ඊළම් යුද්ධයේ කඩඉම් වසර

මෙදමසක් පුරා දිග්ගැසුණු මෙම ලිපි පෙළ ආරම්භ වූයේ ආණ්ඩුවේ 'ඩේලි නිවුස්' පත්‍රය හා සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් සැප්තැම්බර් 04 වෙනිදා නාවික හමුදාපතිවරයා විසින් කරන ලද ප්‍රකාශයක් නිමිති කොටගෙන ය. 'යුද්ධය දිනන්නට පුළුවන්දැයි' සාකච්ඡාව අවසානයේ පුවත්පත් කලාවේදියා විමසා තිබිණ. ''මේ අධියරේදී අපිට මේ යුද්ධය දිනන්න බැරි වුණොත්, අපි කවදාවත් මේ යුද්ධය දිනන්නේ නැති'' බව නාවික හමුදාපතිවරයා කීවේය. ඇතැම්විට නාවික හමුදාපතිවරයාම වුවද සවිඥාණික නොවීමට ඉඩ ඇති ගැඹුරු ඇත්තක් ඒ පිළිතුරෙහි සැඟව තිබිණැයි මෙහි ආරම්භයේදීම ලීවෙමි. ඒ මක් නිසාද?

මුලින්ද පෙන්වා දුන් පරිදි එක් අතකින් පශ්චාත් යටත් විජිත ලංකාවේ පුළුල්ම දේශපාලන සන්ධානය ජාතිකව නිර්මාණය කිරීමට හතරවෙනි ඊළම් යුද්ධය හේතු වී තිබේ. ප්‍රතිපත්තිමය පරස්පරතා ඇතැයි සැළකුණු විරාගත දේශපාලන කණ්ඩායම් අති මහත් බහුතරයක් එකිනෙක හා සම්බන්ධ කෙරෙමින්, කරුණා අම්මාන්ගේ සිට ජාතික හෙළ උරුමය දක්වා සියල්ලන් විනිවිදිමින් යා කෙරෙන කොටි විරෝධී 'තිරස් පක්ෂ සන්ධානය' එහි ප්‍රතිඵලයයි. අනෙක් අතින් ශ්‍රී ලංකා රාජ්‍යයේ යුදමය හස්තය සවිමත් කරන කලාපීය සහ ගෝලීය බලවතුන්ගෙන් සමන්විත 'ත්‍රස්ත විරෝධී අක්ෂයක්' නිර්මාණය කිරීමට එයට හැකි වී තිබේ. පසමිතුරු හූ දේශපාලනික උවමනාවන් පෙරදැරි කොටගත් පකිස්ථානයත්, ඉන්දියාවත්, චීනයත්, ඇමරිකාවත්, ඉරානයත්, ඊශ්‍රායලයත්, බටහිර, මධ්‍යම සහ නැගෙනහිර යුරෝපීය රටවලුත්, රුසියාවත් විනිවිදින ත්‍රස්ත විරෝධී 'තිරස් ජාතික සන්ධානය' එහි ප්‍රතිඵලයයි. හතරවෙනි ඊළම් යුද්ධය ජාතිකවත්, ජාත්‍යන්තරවත් පිළිමළුන් එකිනෙකා හා යා කෙරෙන අසව්වක් බවට පෙරළී ඇත්තේ ඒ අනුව ය.

මෙහිදී රාජපක්ෂ පාලන තන්ත්‍රයට ඇතුළතින් සහ පිටතින් ගොඩනැගී ඇති ජාතික සන්ධානය සාමාන්‍ය නිරීක්ෂණ මගින් ප්‍රත්‍යක්ෂ කරගත හැක්කකි. නමුත් කලාපීය සහ ගෝලීයව ගොඩනැගී ඇති 'පසමිතුරන්ගේ සන්ධානය' තහවුරු කෙරෙන බොහෝ සාක්ෂි යට කී ආකාරයේ සාමාන්‍ය නිරීක්ෂණයන්ට ග්‍රහණය නොවේ. ඒ යථාර්ථයන් සැඟව ඇත්තේ සාමාන්‍ය ජනයාගේ දැනුවත්භාවයේ සීමාවන්ගෙන් ඔබ්බෙහි ය. 'රට කැඩීමේ භාහිර කුමන්ත්‍රණ' ගැන දකුණේ රජයන මනෝ භ්‍රාන්තිය පදනම් වන්නේ ඒ නොදැනුවත්කම මත ය. ශ්‍රී ලංකා රාජ්‍යයේ යුද ව්‍යාපෘතිය අඩාල කිරීමට දිවා රෑ දියත්ව ඇතැයි කියන 'භාහිර බලවේගයන්ගේ කුමන්ත්‍රණකාරී සැළසුම්' පිළිබඳ පොදුජනයා අතර පවතින භීතිය, දකුණේ ආණ්ඩු විරෝධී මනෝභාවයන්ට තිරිංගයක් වශයෙන් ක්‍රියා කරයි. නමුත් මූර්ත සාක්ෂි ඇසුරෙන් ලියැවුණු මෙම ලිපි පෙළ මගින් මේ තාක් අවධානය යොමු කරන ලද්දේ, යට කී සාමාන්‍ය නිරීක්ෂණයන්ට හසු නොවන යථාර්ථයන් හැකිතාක් ගවේෂණය කරනු පිණිස ය. එනම් ශ්‍රී ලංකා රජයේ හස්තය යුදමය වශයෙන් ශක්තිමත් කොට පවත්වාගෙන යාමට මේ බොහෝමයක් 'බාහිර බලවේග' විසින් මේ දක්වා පෙන්නුම් කොට ඇති සක්‍රීය උදෙයා්ගයේ ස්වභාවය වටහා ගනු සඳහා ය.

නමුත් අභ්‍යන්තර සිවිල් යුද්ධයකට මැදි වීමෙන් දුර්මුඛ විය හැකි පාලන තන්ත්‍රයක පදනම්, සෘජු යුදමය ආධාර මගින් පමණක් නොව, එවැනි යුද්ධයක් විසින් තර්කානුකූලව ආර්ථිකය මත ඇති කරන පීඩනය අවම කිරීමට දායක වීම මගින්ද සහතික කළ හැකිය. ඉහළ යන යුද වැය හේතුවෙන් යුද කලාපයන්ගෙන් භාහිර ප්‍රදේශයන් තුළ ක්‍රමානුකූලව උත්සන්න විය හැකි පොදුජන දුක් ගැනවිලි සමනය කිරීමේ හැකියාව සැපයෙන්නේ යුදමය ආධාරයන්ට අමතරව ගලා එන සංවර්ධන ආධාර මගිනි. යුදවන් රටකට සැපයෙන සංවර්ධන ආධාර ඇත්ත වශයෙන්ම ක්‍රියා කරනුයේ, යුද්ධය විසින් ආර්ථිකය මත ඇති කරන පීඩනය උරා ගැණෙන 'කම්පන අවශෝෂකයක්' *(shock absorber)* වශයෙනි. හතරවෙනි ඊළම් යුද්ධය ඇවිළ යන ශ්‍රී ලංකාව මීට මනා නිදසුනකි.

### යුද්ධයේ බිල වටෙන් ගෙවීම

සංවර්ධන හා මානුෂීය ආධාර ක්ෂේත්‍රය තුළ ඉන්දියාවත්, චීනයත්, ඉරානයත් ඉකුත් දෙවසර තුළ ශ්‍රී ලංකා රජයේ ගැළවුමට මැදිහත්ව ඇති ආකාරය මෙම ලිපි පෙළෙහි පළමු හා දෙවන කොටස් මගින් දළනටමත් සාකච්ඡා කොට තිබේ. නමුත් එකී රටවල් 'අපේ මිතුරු පෙරදිග කඳවුරේ' රටවල් වශයෙන් ලේබල් කිරීම සාමාන්‍ය ප්‍රවණතාවකි. වැදගත් වන්නේ 'කුමන්ත්‍රණකාරී බටහිර බලවේග' මේ සම්බන්ධයෙන් දක්වන දායකත්වය වටහා ගැනීමයි.

ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ *(OECD)* සංවර්ධන සහායක කමිටුවට *(Development Assistance Committee - DAC)* සාමාජික රාජ්‍යයන් 22ක් සහ යුරෝපා කොමිසමද ඇතුළත් වේ. බ්‍රිතාන්‍ය ප්‍රමුඛ යුරෝපා සංගමයේ සාමාජික රාජ්‍යයන්ද, එක්සත් ජනපදය සහ ස්කැන්ඩිනේවියානු රටවල් මෙන්ම ජපානයද මේ අතර සිටියි. සංවර්ධනය වන රටවල දුගීභාවය සහ සංවර්ධනය පිළිබඳ ගැටළු කෙරෙහි අවධානය යොමුකිරීම ප්‍රමුඛතාව කොටගත් මෙම කමිටුව විසින් 2006 වසර සඳහා නිර්දේශිත ආධාරලාභීන් 15 දෙනා අතරට ශ්‍රී ලංකාවද අයත් සේ සැළකිණ. *Development Initiative* සංවිධානය විසින් 2008 පෙබරවාරියේදී නිකුත් කරන ලද *Global Humanitarian Assistance Report* ලියැවිල්ලේ 2007/2008 කලාපයට අනුව ඊළම් යුද්ධය ඇවිළ ගිය 2006 වසර තුළ පමණක් ශ්‍රී ලංකාව සඳහා නිර්දේශිත ද්වීපාර්ශ්වික ආධාර ප්‍රමාණය ඩොලර් මිලියන 108කි. අදාළ කාල සීමාව තුළ දී ශ්‍රී ලංකාවට සපයා ඇති ආධාර ප්‍රමාණය ඒ ඒ රටවල් විසින් පොදුවේ සපයනු ලබන සමස්ත ආධාර ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් වශයෙන් සැළකූ විට ආධාරලාභීන් අතර ලංකාවට හිමිවන ස්ථානය පැහැදිලි වේ. ඒ අනුව ඔස්ට්‍රියාව, ග්‍රීසිය, පෘතුගාලය සහ ඩෙන්මාර්කය යන රටවල් විසින් 2006 වසර සඳහා ඉහළම ආධාර ප්‍රමාණයක් නිර්දේශ කරනු ලැබූ රටවල් තුන අතරට ශ්‍රී ලංකාව අයත් වේ. ඔස්ට්‍රියාව විසින් වෙන් කරනු ලබන සමස්ත මානුෂීය ආධාර ප්‍රමාණයන්ගෙන් ලංකාවට සැපයී ඇති ප්‍රමාණය 31%කි. ග්‍රීසියේ 8%කි. පෘතුගාලයේ 18%කි. ඩෙන්මාර්කයේ 8%කි. ජර්මනියේ 6%කි. ස්පාඤ්ඤයේ 5%කි. *(Global Humanitarian Assistance Report 2007/2008)*

ආණ්ඩුවේ යුද න්‍යාය පත්‍රයට කෙරෙන 'බටහිර කෙණෙහිලිකම්' ගැන මැසිවිලි තිබියදීත්, ලංකාව සඳහා සැපයෙන සංවර්ධන ආර්ථික ආධාරයන්ට යුද්ධය බාධාවක් වී නැති ආකාරය ආණ්ඩුවේම නිල සංඛ්‍යා ලේඛණ හා ප්‍රකාශ මගින් තහවුරු වේ. නියෝජ්‍ය මුදල් හා සැළසුම් ඇමති රන්ජිත් සියඹලාපිටියගේ ප්‍රකාශයක් උපුටා දක්වන 2007 මැයි 03 වෙනිදා ආණ්ඩුවේ 'ඩේලි නිවුස්' පුවත්පතට අනුව, 2007 වසර සඳහා පොරොන්දු ආධාර ප්‍රමාණයෙන් රුපියල් බිලියන 72ක් හෙවත් 75%කට වැඩි ප්‍රමාණයක් වසරේ මුල් මාස 4 තුළදීම ලැබී තිබිණ. ඉන් වැඩිම පංගුවක් නියෝජනය කරන ලද්දේ, ඩොලර් මිලියන 347ක ආධාර සැපයූ ජපානය

විසිනි. මීට අමතරව ස්පාඤ්ඤය, ජර්මනිය සහ ඔස්ට්‍රියාව විසින් එම කාල සීමාව තුළ සපයා ඇති ආධාර ප්‍රමාණය ඩොලර් මිලියන 46කි. *(Government secures 75% of 2007 aid quantum - Daily News / 03.05.2007)* 2007 වසරේ මුදල් අමාත්‍යාංශ වාර්තාවන්ට අනුව 2007 වසරේ ජනවාරි සිට මැයි මාසය දක්වා වූ පළමු භාගය තුළ ලද සමස්ත ආධාර ප්‍රමාණය ඩොලර් මිලියන 874කි.

සෘජු ද්විපාර්ශ්වික ආධාරවලට අමතරව බහුජාතික මූල්‍ය ආයතන විසින් සපයන ණය ආධාරයන්ගේ ගලා ඒම ඊළම් යුද්ධය හේතුවෙන් අඩාල වී නැත. නිදසුනක් වශයෙන් ඉහත කී කාල සීමාව තුළ ශ්‍රී ලංකාවට සැපයුණු ණය ආධාරයන්ගෙන් ඩොලර් මිලියන 300ක්ම සැපයී තිබුණේ ආසියානු සංවර්ධන බැංකුවෙනි. ශ්‍රී ලංකාව පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රකාශිත 2008 වසර සඳහා වන දත්ත සම්පිණ්ඩන ලියැවිල්ලට අනුව, 2007 වසර සඳහා එම බැංකුව විසින් ශ්‍රී ලංකාව සඳහා අනුමත කරන ලද සමස්ත ආධාර මුදල ඩොලර් මිලියන 430කි. මෙයින් වැඩි පංගුවක් සපයනු ලැබ තිබුණේ වරාය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය නඟා සිටුවීම, ධරණීය බල ශක්ති අධිකාරිය සහ අධ්‍යාපනය ආදී වූ සංවර්ධන හා සුබ සාධන ක්ෂේත්‍රයන් ඉලක්ක කොටගෙන ය. මහින්ද චින්තනය හා ඒකාබද්ධ වී සංවර්ධන ආධාර වැඩසටහන් දියත් කිරීමට 'මහින්ද චින්තනය' මත දියත්ව ඇති යුද්ධය කිසිසේත්ම බාධාවක් වී නොමැති බව ආසියානු සංවර්ධන බැංකුවේ ලියැවිලි මගින්ම සනාථ වේ: ''ශ්‍රී ලංකාව ඉලක්ක කොටගත් සිය දිගුකාලීන මැදිහත්වීම් සඳහා පදනමක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව යොදාගනු ඇත්තේ 'මහින්ද චින්තනයයි.'...යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීමට සැළසුම් කරන ආසියානු සංවර්ධන බැංකුවේ 2008 වැඩසටහනද මහින්ද චින්තනයට සමගාමී වේ.'' *(Asian Development Bank and Sri Lanka - A Fact Sheet/2008)* 2008 පෙබරවාරි මාසයේ ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකාවට අදාළ ආසියානු සංවර්ධන බැංකුවේ වාර්තාවකට අනුව 2008 වසර සඳහා යාවත්කාලීන කරන ලද පොරොන්දු ආධාර ප්‍රතිපාදනය ඩොලර් මිලියන 265කි. *(ADB Country Operations Business Plan - Sri Lanka / 2008 - 02 පිටුව)*

2008 වසරේ මුල් පස් මාසය අවසන් වන විට ශ්‍රී ලංකාව සඳහා සැපයීමට පොරොන්දු සමස්ත ණය ආධාර ප්‍රමාණය ඩොලර් මිලියන 1,049ක් වූ අතර එයින් ඩොලර් මිලියන 450ක් ඉරානය විසින් සැපයීමට එකඟතාව පළ වී තිබිණ. ඊට අමතරව ඩෙන්මාර්කය ඩොලර් මිලියන 155ක්ද, ජපානය මිලියන 42.2ක්ද, ප්‍රංශය මිලියන 23.3ක්ද, ඔස්ට්‍රියාව මිලියන 29.6ක්ද සැපයීමට ඉදිරිපත්ව සිටියහ. 2008 වසරේ ඉහළම ආධාරක රාජ්‍යය වශයෙන් ඉරාන ඉස්ලාමීය ජනරජය හුවා දක්වීමට ඇතැමුන් උත්සාහ කළද ඉරානය විසින් ලබාදෙන ලද ණය ආධාර මුදල එක් වසරක් සඳහා සැපයුණු මුදලකට වඩා උමා ඔය ජල විදුලි ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා වසර ගණනාවකට විහිදෙන ලෙස ලබාදුන් ණයක් සේ සැළකේ. ඒ අනුව බලතොත් බහුජාතික මූල්‍ය ආයතන හැරුණු විට ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන ණය ආධාර සැපයුම් තවදුරටත් ජපානය ප්‍රමුඛ බටහිර පාක්ෂික කඳවුරේ රටවල් වෙතින් ගලා එනු දක්නට ලැබේ. *(Changing Support: Iran Tops Sri Lanka donors up to May 2008 - www.lbo.lk / 14.07.2008)*

2005 සහ 2006 අවුරුදුවලට සාපේක්ෂව 2007 වසරේදී මෙකී ''කුමන්ත්‍රණකාරී බටහිර රාජ්‍යයන්'' සමඟ කෙරෙන අපනයන ගණුදෙනුවල ස්ථාවර වර්ධනය විසින් පෙන්නුම් කෙරෙන්නේද මෙවැනිම යථාර්ථයකි. වාර්ෂික අපනයන වර්ධන ප්‍රතිශතයන් සළකා බලන විට බ්‍රිතාන්‍ය හා කෙරෙන අපනයන ගණුදෙනුවල ඉහළ යාම 2006ට සාපේක්ෂව 2007දී 15.45%කි. ජර්මනියට අදාළව 32.84%කි. ප්‍රංශයට අදාළව 13.85%කි. ස්වීඩනයට අදාළව 56.37%කි. පින්ලන්තයට අදාළව 92.47%කි. නෙදර්ලන්තයට අදාළව 24.10%ක් වන විට ග්‍රීසියට අදාළව අපනයන වර්ධන ප්‍රතිශතය 48.51%කි.

මීට අමතරව 2009 සිට 2012 දක්වා වූ කාල සීමාවට අදාළව 2008 මැයි මාසයේදී ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකාව පිළිබඳ වන ලෝක බැංකු උපායික ලියැවිල්ල විසින් පෙන්නුම් කරන්නේද, තව දුරටත් නිර්බාධිතව සිදුවන ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්ගේ ණය ආධාරවල ගලනයයි. අදාළ තෙවසරක කාලය සඳහා යෝජිත ලෝක බැංකු ණය ආධාර මුදල ඩොලර් මිලියන 900කි. *(World Bank Country Assistance Strategy for the Period FY 2009--2012 - 07.05.2008 / 32 පිටුව)* මෙයින් 40%ක් ග්‍රාමීය මාර්ග සංවර්ධනයට වෙන් කෙරෙන අතර යුද්ධයෙන් බාධා සිදු නොවුණහොත් 30%ක් වැය කෙරෙනු ඇත්තේ යුද කලාපයේ ප්‍රතිසංවර්ධන කටයුතු සඳහා ය.

**ස්ථායීකරණ මෙහෙයුම්**

කෙසේ වුවද රජය විසින් දෙමළ ගරිල්ලන්ගෙන් 'මුදාගත් ප්‍රදේශ' වශයෙන් සැළකෙන කලාපයන් ප්‍රතිසංවර්ධනය සඳහා එක්සත් ජනපදය ප්‍රමුඛ ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසින් දක්වන උද්‍යෝගය විසින් පෙන්නුම් කෙරෙන්නේද රජයේ යුද සැළසුම් පිළිබඳ වාචිකව ප්‍රකාශිත ආකල්පයන්ට පරස්පර යථාර්ථයකි. නිදසුනක් වශයෙන් දැනටමත් මුදාගත් ප්‍රදේශ වශයෙන් සැළකෙන නැගෙනහිර පළාතේ යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන් වැඩසටහන් සම්බන්ධයෙන් වඩාත්ම සක්‍රීය ආයෝජකයා වී ඇත්තේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සි *(USAID)* ආයතනයයි. රජයේ ප්‍රති-ගරිල්ලා යුද ක්‍රියාන්විතයන් *(counter-guerrilla opertaions)* හා වෙන් කළ නොහැකි ලෙස බැඳුණු 'ස්ථායීකරණ මෙහෙයුම්' *(stability operations)* බොහෝමයක් දියත් කෙරෙන්නේ *USAID* අනුග්‍රහයෙනි. අඛණ්ඩ මිලිටරි පීඩනයන්ට භාජනය කරන ලද ප්‍රජාවන් ඉලක්ක කොට දියත් කරන අස්වැසුම් ක්‍රියාදාමයන් *(pacification process)* සේ යුද න්‍යායේදී හඳුන්වනු ලබන මෙකී ක්‍රියාමාර්ග ඇත්ත වශයෙන්ම යුදමය සැළසුම්වලම අවියෝජනීය කොටසකි. 2008 සිට 2012 වසර දක්වා වූ සිව් අවුරුදු කාල සීමාවක් සඳහා *USAID* ආයතනය විසින් දියත් කොට ඇති දෙවැදෑරුම් 'ආර්ථික සහ සමාජ පරිවර්ථන වැඩසටහන' *(Economic and Social Transition - EAST)* ජාතිය ගොඩනැගීමේ අමත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය මෙන්ම ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව දියත් කෙරේ. අදාළ වැඩසටහන යටතේ දියත් කෙරෙන 'ප්‍රාදේශීය පාලනයන් සඳහා වූ සහායක' *(Supporting Regional Governance - SuRG)* සැළැස්මෙහි ප්‍රකාශිත මූලික අරමුණු හතරකි. පළමුවැන්න සමාජ සාධාරණත්වය වර්ධනයයි. දෙවැන්න, පළාත් සහ ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීමයි. තෙවැන්න, රාජ්‍ය ආයතන සහ පුරවැසියන් අතර අන්තර් ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනයයි. සිව්වැන්න, නැගෙනහිර ජනමාධ්‍යකරුවන් හා මාධ්‍ය ආයතන ශක්තිමත් කිරීමයි. වැඩසටහන *'**2007 වසරේදී නැගෙනහිර පළාතේ ඇති වූ සාධනීය වර්ධනයන්ට සහාය දැක්වීම අභිලාෂ කොටගත්තක්**'* බව ව්‍යාපෘති හැඳින්වීමේම දක් වේ. මේ යටතේ රජයේ හමුදාවන් යටතට පත් නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ මේ වසරේ අගෝස්තු මාසය වන විට ක්‍රියාවට නංවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 263කි. මඩකළපුවේ 118කි. අම්පාරේ 262කි. *(http://srilanka.usaid.gov/programme_surg_overview.php?prog_id=7)*

එක්සත් ජනපද සංවර්ධන ඒජන්සිය හැරුණු විට මෙකී 'ස්ථායීකරණ මෙහෙයුම් සහ අස්වැසුම් ක්‍රියාදාමයන්' කෙරෙහි ඇති කැමැත්ත අන්තර්ජාතික මූල්‍ය ආයතන විසින්ද දැනටමත් පෙන්නුම් කොට තිබේ. සැප්තැම්බර් 02 වෙනිදා ජනාධිපති රාජපක්ෂ හමු

වූ ලෝක බැංකුවේ දකුණු ආසියාතික කලාපය භාර උප සභාපතිනී ඉසබෙල් ගෙරේරෝ, නැගෙනහිර පළාත මෙන්ම උතුරු පළාතද රජයේ හමුදා පාලනයට ගන්නේ නම් එහි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට කැමැත්ත පළ කොට තිබිණ. *(World Bank financial aid for Eastern Development in Sri Lanka - www.colombopage.com / 02.09.2008)*

**'යළිත් මුලට' නොහොත් අවසාන සම්පිණ්ඩණය**

ඉහත කරුණු දැක්වීම් අපගේ සාකච්ඡාවෙහි අවසානය කරා මග විවර කොට තිබේ. මේ තාක් කල් දීර්ඝ වශයෙන් කරන ලද කරුණු දැක්වීමෙහි සම්පිණ්ඩණාත්මක සාරය විමසා බැලීම වැදගත් වන්නේ එබැවිනි.

තව දුරටත් ප්‍රතික්ෂේප කළ නොහැකි පරිද්දෙන්, ඊළම් යුද ඉතිහාසයේ කඩඉම් න්ධිස්ථානයක් බවට සිව්වෙනි ඊළම් යුද්ධය දැනටමත් පෙරළී තිබේ. එක් අතකින් ජාතික වශයෙන් ගොඩනංවා ඇති 'ඊළම් විරෝධී දේශපාලන සන්ධානය' ඒ සඳහා මේ තාක් ගොඩ නැංවූ පළල්ම ජාතික දේශපාලන බල හවුලයි. අනෙක් අතින්, කලාපීය සහ ගෝලීය වශයෙන් ගොඩනංවා ඇති 'ත්‍රස්ත විරෝධී ගෝලීය සන්ධානය' දෙමළ ගරිල්ලා ව්‍යාපාරයට එරෙහි ජාත්‍යන්තර පීඩනය එල්ල කිරීමට ගොඩනංවන ලද වඩාත්ම කාර්යක්ෂම ගෝලීය බල හවුලයි. 'ඩේලි නිවුස්' සාකච්ඡාවේදී නාවුක හමුදාපතිවරයාගේ වදන් පුනරුච්ඡාරණය කරතොත්, 'මෙවර බැරි නම් කවර කලෙකවත් බැරි' වන්නේ මේ සුවිශේෂී යථාර්ථයන් හේතුවෙනි. දෙන ලද ජාතික දේශ සීමාවක් තුළ නීත්‍යානුකූල ජාතික රාජ්‍යයක නිල සන්නද්ධ හමුදාවක් සහ ඊට ප්‍රතිමුඛව සිට එහි බලාධිකාරයට අභියෝග කරන සන්නද්ධ ගරිල්ලා ව්‍යාපාරයක් අතර ඇවිළ යන බව බැලූ බැල්මට පෙනෙන හතරවෙනි ඊළම් යුද්ධය, දැන් ඇත්ත වශයෙන්ම පරාවර්ථනය කරන්නේ ඉන් එහා ගිය කලාපීය සහ ගෝලීය යථාර්ථයකි. එක්කෝ ඒකීය රාජ්‍යයේ ඒකාබද්ධ ජාතික දේශපාලන බලයට පිටුබල සපයන ජාත්‍යන්තර යුද හා මූල්‍ය සහයෝගීතාව විසින් දෙමළ ගරිල්ලා ව්‍යාපෘතිය අතුගා දැමිය යුතු ය. නැතහොත්, ඉතිහාසයේ මුහුණ දුන් වඩාත්ම පැතිරුණු යුද දේශපාලන සන්ධානයේ ඒකාබද්ධ වැටලීමෙන් ගැලවී පෙරළා සිය ජාතික ඉල්ලීමෙහි දේශපාලන ධජය ප්‍රතිෂ්ඨාපනයට දෙමළ ගරිල්ලන් සමත් විය යුතු ය. ජාතික, කලාපීය සහ ගෝලීය අක්ෂයන් ඔස්සේ තීව්‍ර කෙරෙන 'ත්‍රස්ත විරෝධී' ඒකාබද්ධ පීඩනයට මුහුණදීමට අවිගත් දෙමළ ගරිල්ලන් සමත් වනු ඇතිද යන්න දැන් උරගා බැලෙන යථාර්ථයයි. එය, වෙන් වූ දෙමළ ඊළම් රාජ්‍යයක් පිළිබඳ අරමුණට අදාළව පමණක් නොව, සිංහල කේන්ද්‍රීය ඒකීය රාජ්‍යයක පැවැත්ම පිළිබඳවද තීරණාත්මක ලිට්මස් පරීක්ෂාවක් වීමට නියමිතව තිබේ.

2001 සැප්තැම්බර් 11 වෙනිදායින් පසු ලෝකය පිළිබඳ වැදගත් පර්යේෂණ භූමියක් බවට දැන් ශ්‍රී ලංකාව පෙරළී ඇත. වන්නියේ දෙමළ ගරිල්ලන්ගේ බලකොටු දොරටුවට තට්ටු කරමින් සිටින්නේ ඉරාකයේ හෝ ඇෆ්ඝනිස්ථානයේ පවා දක්නට නොලැබෙන තරමේ පළල් මුත් සැඟව පවතින, කලාපීය සහ ගෝලීය යුද - දේශපාලන සන්ධානයක යථාර්ථයකි. ''*ලෝකය භ්‍රමණය වන්නේ මානව යුක්තිගරුකභාවය පිළිබඳ චක්‍රය වටා නොවේ. සෑම රටක්ම ක්‍රියාකරන්නේ ස්වකීය ජාතික ස්වාර්ථයන් ප්‍රවර්ධනය වෙනුවෙනි. අධ්‍යතන ලොවෙහි හර පද්ධතීන් තීරණය කරනු ලබන්නේ මානව සහ සිවිල් අයිතිවාසිකම් වැනි සදාචාරාත්මක මූලධර්මයන් නොව, ආර්ථික සහ වාණිජ වටිනාකම් විසිනැ*'' යි විමුක්ති කොටි සංවිධානයේ නායක වේලුපිල්ලෙ ප්‍රභාහරන් විසින් ප්‍රකාශ කරන ලද්දේ තුන්වෙනි ඊළම් යුද සමයෙහිය. අවශ්‍ය නම් එය දැන් එළඹ ඇති වකවානුව පිළිබඳ පුරෝකථනයක් වශයෙන්ද සැළකීම වරදක් නොවේ.

2008 ජනවාරි මාසයේ දෙමළ ඊළම් රූපවාහිනී විකාශය හා සම්මුඛ සාකච්ඡාවකට එක් වූ දෙමළ විමුක්ති කොටි සංවිධානයේ ජ්‍යෙෂ්ඨ සාමාජික කා.වේ.බාලකුමාරන් මෙසේ කියා තිබිණ: ''සිදුවීමට ඉඩ ඇති විනාශයෙහිත්, රුධිර ස්නානයේත් බරපතලභාවය පිළිබඳව අපි හොඳින් සබුද්ධිකව සිටිමු. සිදුවිය හැකි දෙයට මුහුණ දෙනු විනා වෙනත් විකල්පයක් දෙමළ ජනතාව හමුවේ නොවේ. නිදහසේ අග්නි ජාලාව මෙළවූ පසු ආපසු හැරීමක් නැත. පරිත්‍යාගයන් ඒ තීරණයෙහිම කොටසක් වන අතර අපගේ ජනයා ඒ ගැන අවබෝධයෙන් සිටියි. අපගේ අරමුණු මුදුන්පත් කරගනු වස් අපගේ ශක්තිය පිළිබඳව අපි විශ්වාසයෙන් පසු වෙමු....2008 වසරේදී කොටි සටන්කරුවන් විසින් ශ්‍රී ලංකාවේ දිග්ගැසුනු ගැටුමට නිරාකූලතාව කැඳවාගෙන එනු ඇත.'' *(2008 will bring clarity to Sri Lanka's conflict :Balakumararan - www.tamilnet.com / 02.01.2008)*

සිව්වෙනි ඊළම් යුද්ධය පිළිබඳ ඉතිහාස විනිශ්චයට තව කොතෙක් කල් ඇති දැයි කිසිවෙක් නොදනී. මේ බිහිසුණු ව්‍යාකූල සමය නිරාකූල කරනු ඇත්තේ ඒ ඉතිහාස විනිශ්චය මගිනි.

(අවසානයි)

**රවීස**
*raveesa@googlemail.com*

*රාවය / 2008 නොවැම්බර් 02*